**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය - 2019**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 7 (ආ) ඡේදය පරිදි වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළදී ගලායාම් ස්වභාවයෙන් හෝ වත්කම් පරිභෝජන ස්වභාවයෙන් හෝ බැරකම් ඇති වීම් ස්වභාවයෙන් සිදුවන ආර්ථික ප්‍රතිලාභයන්ගේ හෝ සේවා ශක්‍යතාවන්ගේ අඩුවීම් සියල්ල ගිණුම්ගත කලයුතු වුවත් 2019 වර්ෂයට අදාලව 2020 වර්ෂයේදී ගෙවීම් කරන ලද රු. 2,037,242 ක් වූ ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් හා එකතුව රු. 8,541,394 ක් වූ පුහුණු උපකරණ හා කාර්යාල උපකරණ මිලදීගැනීම් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් දේපල | 2019 වර්ෂයේදී නියමිත ප්‍රාග්ධන මුදල් භාණ්ඩාගාරයෙන් නොලැබීම හේතු කොට ගෙන මෙම ගෙවීම් සිදු කිරීමට නොහැකි විය. 2020 වර්ෂයේ ප්‍රතිපාදන වලින් මෙම ගෙවීම් සිදු කර ඇත. ඒ අනුව 2020 වර්ෂයේදී ගිණුම් වලට ගැලපීම් සිදු කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිරියත උපකරණ හා ජංගම වගකීම් රු. 10,578,636 කින් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතම සෑම වර්ෂ 03 කට හෝ 05 කට වරක් වත්කම් ප්‍රත්‍යාගණනය කලයුතු වුවත් අධිකාරිය සතු ඉඩම් හා ගොඩනැගිලි 2008 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | පිළිගනිමි. ඉඩම් ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම සඳහා තක්සේරු දෙපාර්තුමේන්තුව වෙත යොමු කර ඇත. තක්සේරු වාර්තා ලැබුණ විගස ගිණුම් වල ගැලපීම සිදු කරනු ඇත. | යොමුගත ප්‍රමිතිය පරිදි ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 12 අනුව සින්නක්කර ඉඩම් හා බදු ඉඩම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙන්කර දැක්විය යුතු වුවද එකතුව රු. 9,842,565 ක් වූ කල්බදු ඉඩම් 05 ක් ඉඩම් යටතේ දක්වා තිබූ අතර එම කල්බදු ඉඩම් වලට අදාලව යොමුගත ප්‍රමිතය අනුව ක්‍රමක්ෂය කර නොතිබුණි. | මේ වන විට අධිකාරිය සතු රජයට අයත් බදු ඉඩම් සඳහා අයිතිය ලබා ගැනීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | යොමුගත ප්‍රමිතය අනුව ක්‍රමක්ෂය ගණනය කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම කෙටියෙන් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට අනුව සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය ප්‍රමාණය රු. 472,331,728 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ විලම්භිත ආදායම් ප්‍රදාන ලෙස රු. 475,521,999 ක් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු. 3,190,271 කින් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මේ වන විටත් මේ තත්වය නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වර්ෂයට අදාල සියළු ආදායම් වියදම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව 2015 වර්ෂයේ දී ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියට පවරාදී තිබූ පොත් අගය රු.202,278,158 ක් වූ ඉඩම 2019 දෙසැම්බර් 31 දක්වාම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් වටිනාකමින් ඉවත් කර නොතිබුණි. ඒ වෙනුවට අධිකාරිය වෙත ලැබී | මෙම ඉඩම නැවත තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තුමේන්තුව වෙත යොමු කර ඇත. තක්සේරු වාර්තා ලැබුණු පසු ගිණුම් වලට ගැලපීම් සිදු කරනු ඇත. | ඉදිරියේදී ගිණුම් ප්‍රකාශන සකස් කිරීමේදී ජංගම නොවන වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණු අක්කර 02 රූඩ් 03 යි පර්චස් 38.38 ක් වූ ඉඩම ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දිනට මෝටර් වාහන පන්තිය යටතේ ගිණුම්ගත කර තිබුණු පිරිවැය රු.4,496,902 ක් වූ මෝටර් රථ 39 ක් හා පාපැදි 25 ක් 2018 වර්ෂයේදී සිදුකර තිබුණු ප්‍රත්‍යාගණනයේදී අත්හැරී තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී ද එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන හඳුනා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහාත් නිර්දේශ ලබා ගැනීම සඳහාත් 05 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර වාර්තාවක් ලබා ගෙන ඇත. ඒ අනුව කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත. | ඉදිරි වර්ෂයේදී ගිණුම් ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ඇ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ ඉඩමේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබියදී සමාලෝචිත වර්ෂය තුළ එම ඉඩම් මැනීම සඳහා ගෙවීම් කර තිබුණු රු. 1,670,383 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් අත්පත් කර ගැනීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉඩම් මැනීම සඳහා කරනු ලබන වියදම ප්‍රාග්ධන වියදමක් ලෙස සැලකිය යුතුය. ඉඩම අත්පත් කර ගත් පසු ඉඩම තක්සේරු කොට ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉදිරි වර්ෂයේදී ගිණුම් ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ඉ) | මෝටර් වාහන යටතේ ගිණුම්ගත කර නොතිබුණු මෝටර් වාහන 45 ක් 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණනය කර රු. 25,547,000 ක් වූ ප්‍රත්‍යාගණිත වටිනාකම මෝටර් වාහන යටතේ ගිණුම්ගත කර තිබුණි. ප්‍රත්‍යාගණනය කිරීමට පෙර එම මෝටර් වාහන ගිණුම්ගත වී ඇති වත්කම් පන්තිය හඳුනාගෙන එහි පිරිවැය හා ක්ෂය වෙන් කිරීම ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන හඳුනා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහාත් නිර්දේශ ලබා ගැනීම සඳහාත් 05 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර වාර්තාවක් ලබා ගෙන ඇත. ඒ අනුව කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අධිකාරිය සතු සියලු වාහන නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ඊ) | 2018 වර්ෂයේ සිදු කල වත්කම් ප්‍රත්‍යාගණනයේ වටිනාකම් 2018 මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ගත කිරීමේදී වත්කම් පන්ති 3ක එකතුව 33,603,241 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා සමුච්චිත අරමුදලේ ඍණ ශේෂය රු. 12,052,310 ක් වැඩියෙන් සහ ප්‍රත්‍යාගණන අතිරික්තය රු. 21,550,931 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම්ගත කිරීමේදී ප්‍රමාද දෝෂයක් සිදු වී ඇත. ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ඉදිරි වර්ෂයේදී ගිණුම් ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා සමාලෝචිත වර්ෂයේදී ක්ෂය ගණනය කිරීම් පරික්ෂාවේ දී රු. 89,046,292 ක වටිනාකමින් යුත් වත්කම් අත් හැරීම හේතුවෙන් ක්ෂය රු. 11,911,930 ක් අඩුවෙන් ද රු. 15,081,844 ක් වටිනාකමින් යුතු වත්කම් ද්වි ගණනය වී තිබීම හේතුවෙන් රු. 3,563,977 ක ක්ෂය වැඩියෙන් ද ගිණුම්ගත වී තිබුණි. | ගිණුම්ගත කිරීමේදී ප්‍රමාද දෝෂයක් සිදු වී ඇත. ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ඉදිරි වර්ෂයේදී ගිණුම් ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදිව ක්ෂය ගණනය කල යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1996 අප්‍රේල් 30 දිනැති අංක 921/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය | අති විශේෂ ගැසට් පත්‍රයෙන් ඇති කර තිබුණු වෘත්තීය පුහුණු සභා සඳහා සාමාජිකයන්ගේ පත්කිරීම් සඳහා සුදුසුකම් ඇතුලත් කර නොතිබීම හේතුවෙන් ක්ෂේත්‍රයට අදාල විශේෂඥ දැනුම සහිත පුද්ගලයන් පත් නොකිරීම නිසා එම පුහුණු සභා ක්‍රමය අසාර්ථක වී තිබුණි. | වෘත්තීය පුහුණු සභා පත් කිරීමේ බලය ඇත්තේ ගරු අමාත්‍යවරයාටය. ගැසට් පත්‍රයේ පත් කළ යුතු පුද්ගලයන් පිළිබඳව සඳහන් කර ඇත. | පත්කල යුතු පුද්ගලයන්ගේ සුදුසුකම් ඇතුලත් කර නව ගැසට් පත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 48,676,134 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 76,882,490 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 28,206,356 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ පුනරාවර්තන ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු ඉලක්ක සකස් කිරීමේදී හා බඳවාගැනීම් සිදු කිරීමේදී දේශීය ආර්ථිකය ඉහළ නංවා ගැනීමට දායකත්වයක් ලබාදිය හැකි වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර 07 ක් සම්බන්ධයෙන් අඩු අවධානයක් යොමුකර තිබුණු අතර පවතින රැකියා අවස්ථාවන්ට ගැලපෙන පරිදි නව පාඨමාලා හඳුන්වාදීම කෙරෙහි ප්‍රමාණාත්මක අවධානයක් යොමුකර නොතිබුණි. 2019 වර්ෂයට අදාලව ඉලක්ක ළඟාකර ගැනීම්වලින් සියයට 22 ක ප්‍රමාණයක් තොරතුරු සන්නිවේදන හා බහුකාර්ය තාක්ෂණ පුහුණු ක්ෂේත්‍රය තුලින් ආවරණය කරගෙන තිබුණි. | එම පාඨමාලා සඳහා ආධුනිකාවන්ගේ සහභාගීත්වය ක්‍රමයෙන් අඩු වූ බැවින් එම පාඨමාලා ප්‍රමාණය අඩු කිරීමට සිදු විය. තවද ඉහත ක්ෂේත්‍රය සඳහාම වෙන් වූ සම්පත් වලින් බහුල විශේෂිත රජයේ ආයතන ඇති බැවින් අපගේ පාඨමාලාවට ආධුනික ආකර්ෂණය ඉතාම අඩුය. | අධිකාරිය පිහිටුවීමේ පනතේ අරමුණු ඉටු කරගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමුකල යුතුය. |
| (ආ) | 2006 වර්ෂයේ සිට 2015 මැයි මාසය දක්වා සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු.7,898,073 ක අධිභාර මුදල් නොසැලකිලිමත්ව කටයුතු කල නිලධාරීන්ගෙන් අයකර ගැනීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ දී වියදමක් ලෙස කපා හැර තිබුණි. | භාණ්ඩාගාරයෙන් මේ සඳහා වාරික වශයෙන් මුදල් ලැබුණු බැවින් මුදල් ලැබුණු වර්ෂ අනුව ගෙවීම් කර වියදමක් ලෙස ගළපා ඇත. | නොසැලකිල්ලෙන් කටයුතු කල නිලධාරීන්ගෙන් අදාල අධිභාරය අයකල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නව වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීමේ අරමුණින් 2017 හා 2018 වර්ෂ තුලදී දීර්ඝකාලීන බදු පදනම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත | පානදුර මෝදරවිල නව මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා අදාළ සැළසුම් සකස් කර ආංශික නිපුනතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මුදල් ප්‍රතිපාදන වෙන් කළ අතර 2020 වන විට එහි සියළුම ප්‍රසම්පාදන කටයුතු එම ව්‍යාපෘතිය මඟින් අවසන් කර තිබුණද එම වසරේ පැවති වසංගත තත්වය හේතුවෙන් එය ප්‍රමාද වූ අතර ඉන් පසු ව්‍යාපෘතියේ ඉතිරි කාලය තුල මෙය අවසන් කළ නොහැකි බැවින් කොන්ත්‍රාත්තුව | අධිකාරිය පිහිටුවීමේ පනතේ අරමුණු ඉටු කරගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමුකර තීරණ ගැනීම කෙරෙහි |

| | | | |
|---|---|---|---|
| | එකතුව රු. 43,310,340 ක් ගෙවීම් කර ලබාගෙන තිබුණු ඉඩම් 02 ක් 2021 සැප්තැම්බර් දක්වා අදාල අරමුණු සඳහා යොදාගෙන නොතිබුණි. | ප්‍රදානය නොකරන ලදී. 2021 වසරේ අධිකාරිය විසින් ප්‍රාග්ධන වියදම් යටතේ ප්‍රතිපාදන ඉල්ලුම් කලද ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර ලබා දී නොමැත.<br>වනරාජවත්ත ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාව වෙතින් අධිකාරිය මිලදී ගැනීමෙන් පසුව ඉඩම් ප්‍රතිංස්කරණ කොමිෂන් සභාවට විරුද්ධව ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් තුන් වන පාර්ශවයක් විසින් නඩු පවරා ඇත. | කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | අහංගම පැවති හෝටල් පාසැල, පූර්ව ශක්‍යතා අධ්‍යනයකින් තොරව සංචාරක හෝටලයක් බවට පත්කිරීම සඳහා අධිකාරියේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත 2016 හා 2018 කාල පරිච්ඡේදය තුල නවීකරණ කටයුතු සඳහා රු. 124,685,148 ක් ද උපකරණ මිලදී ගැනීම සඳහා නිපුණතා ආංශික සංවර්ධන අරමුදලින් රු. 37,556,018 ක් ද වැය කර තිබුණි. එසේ වුවද 2021 සැප්තැම්බර් මාසය දක්වාම අදාල අරමුණු සඳහා භාවිතා කර නොතිබුණි. | අහංගම පැවති හෝටල් පාසල සංචාරක හෝටලයක් ලෙස නවීකරණය කරනු ලැබුයේ වෘත්තිය පුහුණු අධිකාරියේ හෝටල් ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරන ආධුනිකයන් හට වැඩිදුර පුහුණුවක්ද ලබා දෙමින්, නිපුණ ශිල්පීන් ලෙස ක්ෂේත්‍රයට පිවිසීමට අවස්ථාවක් ලබා දීම අරමුණ කරගෙනය. විටින් විට වෙනස්කම් කරමින් ව්‍යාපෘතිය නිම කිරිමට සැලකිය යුතු කාලයක් ගත වූ බව පිළිගනිමි. මේ අවස්ථාව වන විට හෝටල් ක්ෂේත්‍රයේ වැඩිදුර පුහුණුව ලබා දෙන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීම ආරම්භ කර ඇති අතර, දැනට ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ විවිධ අවශ්‍යතාවයන් (උදා - පුහුණු වැඩසටහන් යනාදිය) සඳහා ද මෙම මධ්‍යස්ථානය යොදා ගනු ලැබේ. එමඟින් අධිකාරියට මුදල් ඉතිරියක් ද සිදු වේ. ඉදිරියේදී දේශීය හා විදේශීය සංචාරකයින් හා වෙනත් රජයේ ආයතන දැනුවත් කිරීමෙන් එම ආයතන වල වැඩමුළු පැවැත්වීමට සූදානම් කර තිබුණි. දැනට උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවන නමුත් ක්‍රම ක්‍රමයෙන් රට යථා තත්ත්වයට පත්වන විට එසේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරමි. | වත්කම් උපරිම කාර්යක්ෂමතාව යෙන් හා ඵලදායීව අරමුණුගත කාර්ය සඳහා යොදාගත යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොතුවිල් හා කරෙයිනගර් හෝටල් පාසල් 02 ක අරක්කැමි පාඨමාලාව සඳහා එකතුව රු. 14,944,049 ක පුහුණු උපකරණ මිලදීගෙන තිබුණද එම පාඨමාලා ආරම්භ කිරීමට පියවර නොගැනීම හේතුවෙන් 2016 වර්ෂයේ සිට 2021 නොවැම්බර් 30 දක්වාම එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි. | දමිළ මාධ්‍ය උපදේශකයන්ගේ හිඟතාවය සහ බඳවාගැනීම් පටිපාටියට අනුකූලව සුදුසුකම් ලත් උපදේශකයින් අඩු බැවින් මෙම පාඨමාලා සඳහා පුහුණු කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇත. නමුත් 2021 වසරේ සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් නොලැබූ නමුදු වැඩිදුර පුහුණුව ලබා දීමෙන් පසු කරෙයිනගර් හෝටල් පාසැලේ උපදේශන කටයුතු සඳහා අනුයුක්ත කිරීමට සුදුසුයැයි තීරණය කරනු ලැබූ අයකු මේ වන විට කුච්චවේලි හෝටල් පාසැලේ පුහුණුව ලබන අතර | වත්කම් උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීව අරමුණුගත කාර්ය සඳහා යොදාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පුහුණුව නිම කර න්‍යායික හා ප්‍රායෝගික ඉගැන්වීම් කුසලතා පරීක්ෂණ සමත් වූ පසු උපදේශක තනතුරේ පිහිටුවීමට අපේක්ෂිතයි. | |
| (ආ) | ආධුනිකයන් සඳහා නවාතැන් පහසුකම් ලබාදීමේ අරමුණින් ජාතික පුහුණු මධ්‍යස්ථානයක කාමර 16 ක්, හෝටල් පාසැල් 02 ක්, දෙමහල් ගොඩනැගිලි 02 ක කාමර 12 ක් ඉදිකර තිබුණ ද නේවාසිකාගාර පාලක පාලිකා තනතුරු හා අනෙකුත් උපකාරක තනතුරු සඳහා බඳවා ගැනීම සිදු නොකිරීමත් ජලය ආදී මූලික පහසුකම් ලබාදී නොතිබීමත් නිසා 2017 වර්ෂයේ සිට එම ගොඩනැගිලි හා උපකරණ නිෂ්කාර්යව පැවතුණි. | ආධුනිකයින් ලෙස මෙම මධ්‍යස්ථානය ආසන්නයේ අය පමණක් සහභාගී වන බැවින් නවාතැන් පහසුකම් සඳහා ඉල්ලුමක් නොමැත. දැනට පුහුණු කිරීම් කටයුතු සඳහා මෙම උපකරණ සහ ගොඩනැගිලි භාවිතයට ගෙන ඇත.<br><br>ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කුච්චවේලි ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය සාර්ථක හා බහුලව කෙරෙන ප්‍රදේශයකි. ඒ හේතුවෙන් එම ප්‍රදේශයේ සහ වෙනත් ප්‍රදේශ වලින් තරුණ තරුණියන් හට එම ක්ෂේත්‍රයේ පුහුණුව ලබා රැකියා අවස්ථාවන් ලබා දීම අරමුණු කරගෙන මෙම මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී. ස්ථිර ජල පහසුකම ලැබුණු පසු එම නේවාසිකාගාරද භාවිතයට ගැනීමට සැළසුම් කර ඇත. | රාජ්‍ය අරමුදල් වැය කරමින් විශාල ඉදිකිරීම් කිරීමට පෙර ඒ පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ඒවා සම්බන්ධයෙන් ඇති ශක්තින් හා තර්ජනයන් ආදිය හඳුනාගත යුතුය. |
| (ඇ) | උපයෝජනය කිරීමේ මූලික සැලසුම් සකස් කිරීමකින් තොරව හා අධිකාරියේ අරමුණට පටහැනි ලෙස, සංචාරකයින් සඳහා ලබාදීමේ අරමුණින් අම්පාර හා යාපනය දිස්ත්‍රික්කවල රු. 91,026,186 ක් වැයකර ඉදිකර තිබුණු හෝටල් කාමර 22 ක් හා මිලදීගෙන තිබුණු රු. 6,102,660 ක ගෘහ උපකරණ 2017 වර්ෂයේ සිට 2021 අගෝස්තු මාසය දක්වාම නිෂ්කාර්යව පැවතුණි. | නිෂ්කාර්යව නොමැත. ආධුනිකයින් පුහුණු වීමේදී පුහුණු කටයුතු සඳහා මෙම භාණ්ඩ පරිහරණය කරනු ලබයි. | රාජ්‍ය අරමුදල් වැය කරමින් විශාල ඉදිකිරීම් කිරීමට පෙර ඒ පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ඒවා සම්බන්ධයෙන් ඇති ශක්තින් හා තර්ජනයන් ආදිය හඳුනාගත යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------------- | ----------------------------- | ------------- |
| ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ අත්පොතෙහි 8.13.4 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව විචලනයන්ගේ සාමාන්‍ය ප්‍රමාණය හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන ඉක්මවා යන්නේ නම් එබඳු විචලන නියෝග නිකුත් කිරීමට ප්‍රථම ප්‍රධාන ගිණුම් නිලධාරීගෙන් අනුමැතිය ලබාගත යුතු වුවත් එක් කොන්ත්‍රාත්තුවකට අදාලව අවිනිශ්චිත ප්‍රතිපාදන සීමාව සියයට 215 කින් ඉක්මවා තිබියදී ප්‍රධාන ගිණුම් නිලධාරීන්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මෙම වියදම් දරා ඇත්තේ ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මුදලින් ඉතිරි වීම් වල වටිනාකමින් සහ අවින්ශ්චිත මුදල් වෙන් කිරීම් වලින් වේ. ව්‍යාපෘති සඳහා වෙන් කර ඇති මුදලින් 10%ක සීමාව ඉක්මවා නොයන පරිදි අදාළ ගෙවීම් ආයතන ප්‍රධානියාගේ අනුමැතියට යටත්ව ගෙවා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කල යුතුය. |